[ සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

# පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)

| 03 | S | I |
|---|---|---|

පැ. දෙකයි.

## 01 ශ්‍රේණිය

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## (3) ත්‍රිපිටක ධර්මය

**සැලකිය යුතුයි :**

- මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 100 ක් ලැබේ.
- සියලු ම ප්‍රශ්න සඳහා පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- **වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. බෝසතාණන් වහන්සේ අසංඛ්‍ය කල්ප ලක්ෂ හතරකට පෙර දඹදිව ...... බමුණු පවුලක සුමේධ නමින් උපත ලදහ.
   (1) උක්කට්ඨා නුවර (2) අමරවතී නුවර (3) කොසඹෑ නුවර

2. සිද්ධාර්ථ බෝසතාණන් දස පාරමිතා පූරණය කිරීම සඳහා අවසන් වරට උපන්නේ ........ රජු ලෙස ය.
   (1) වෙස්සන්තර (2) බ්‍රහ්මදත්ත (3) බිම්බිසාර

3. සිදුහත් කුමරු උපන් ලුම්බිණි සල් උයන පිහිටියේ,
   (1) දෙව්දහ නුවර ය. (2) කපිලවස්තු නුවර ය. (3) රජගහ නුවර ය.

4. සිදුහත් කුමරු මහාමායා දේවියගේ කුස පිළිසිඳ ගත් මොහොතේ උදා වී තිබුණේ,
   (1) බෙරණ නැකත ය. (2) උතුරුසල නැකත ය. (3) අස්විද නැකත ය.

5. **සිංහහනු** රජතුමාට අනුශාසනා කළ අෂ්ට සමාපත්තිලාභී පුරෝහිත බමුණා වූයේ,
   (1) කාලදේවල ය. (2) කොණ්ඩඤ්ඤ ය. (3) සුදත්ත ය.

6. බෝසතාණන් අභිනිෂ්ක්‍රමණය සිදු කරන ලද්දේ,
   (1) පොසොන් පොහෝ දිනකදී ය. (2) ඇසළ පොහෝ දිනකදී ය. (3) නිකිණි පොහෝ දිනකදී ය.

7. **ආකිඤ්චඤ්ඤායතන** නම් තුන්වන අරූපධ්‍යානය ලබා සිටි බලවත් තවුසෙකු වූයේ,
   (1) උද්දකරාම පුත්ත ය. (2) ආළාරකාලාම ය. (3) කාලදේවල ය.

8. ආශ්වාස, ප්‍රශ්වාස කිරීම නවතා, තම හුස්ම ශරීරය තුළ නතර කරමින් සිදුහත් තාපසතුමා වැඩූයේ,
   (1) අප්‍රාණක ධ්‍යානය යි. (2) රූපාවචර ධ්‍යානය යි. (3) පවත්තඵල භෝජී ධ්‍යානය යි.

9. **කළු පැහැති හිස් ඇති සුදු පැහැති පණුවෝ, බෝසතාණන්ගේ දෙපා වෙතින් පැන නැගී දණිස දක්වා වසා පැතිර සිටියහ.** මෙම සිහිනයෙහි අර්ථය වන්නේ,
   (1) අපමණ සිවුපස ලැබෙන බව නමුත්, ඒවාට ගිජු නොවන බව ය.
   (2) වටහා ගත් ආර්ය සත්‍යය ලොවට හෙළි කරන බව ය.
   (3) ගිහි ශ්‍රාවකයන් බොහෝ දෙනෙක් තමන්ට සිටින බව ය.

10. සෑම බෝසත්වරයෙකු ම බුදු වන දවසේ බැස, ස්නානය කරන තොටුපළෙහි නාමය වන්නේ,
   (1) අනෝමතිට්ඨික ය. (2) සුප්පතිට්ඨික ය. (3) අචිරවතී ය.

**(ලකුණු 2x10 = 20)**

[ 2 වැනි පිටුව බලන්න]

**02.** **වඩාත් ගැළපෙන පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

**(කිරිපිඩු, නවය, දීපංකර, සාම ජාතකය, යශෝදරා, බාල සික්ඛා, විශාකා සිටු දියණිය, චූල්ල රාහුලෝවාද සූත්‍රය, තුසිත දෙව් ලොවින්, වචීපරම, මහාමායා )**

i. ...................................... යනු සාමණේරයන් වහන්සේලා හික්මවීම සඳහා ම සකස් වූ ග්‍රන්ථයකි.

ii. සුජාතා සිටු දියණිය බෝසතාණන් වහන්සේට ................................................ පූජා කළා ය.

iii. සැරියුත් මහරහතන් වහන්සේ විසින් රාහුල පොඩි හාමුදුරුවෝ අරහයා ......................... දේශනා කරන ලදී.

iv. ........................................................ විසින් පූර්වාරාමය සාදවා, බුදුරජාණන් වහන්සේට පූජා කරන ලදී.

v. මහා සංඝරත්නයේ ගුණ .........................................කි.

vi. සුමේධ තාපසතුමා ..................................................... බුදුරජාණන් වහන්සේගෙන් නියත විවරණ ලැබූවේය.

vii. ......................................... මඟින් මව්පියන්ට සැළකීමේ උදාර ගුණය උගන්වයි.

viii. සුද්ධෝදන රජතුමා විසින් ...................................... නම් කුමරිය අග මෙහෙසිය ලෙස තෝරා ගන්නා ලදී.

ix. බෝසතාණන් වහන්සේ ................................................................ චුත වී මව්කුස පිළිසිඳ ගත්හ.

x. වචනයෙන් පමණක් සංග්‍රහ කරනුයේ ........................................................... මිතුරා ය.

**(ලකුණු 2x10 = 20)**

**03.** **නිවැරදි වාක්‍ය ඉදිරියෙන් හරි (✓) ලකුණ ද, වැරදි වාක්‍ය ඉදිරියෙන් වැරදි (✕) ලකුණ ද වරහන තුළ යොදන්න.**

i. කේසා, ලෝමා, නඛා, දන්තා, තචෝ යනු තච පඤ්චකය යි. (......)

ii. මහාමයා දේවිය කළුරිය කර **තව්තිසා** දෙව්ලොව උපන්නා ය. (......)

iii. යශෝදරා කුමරිය **මෞර්ය රාජ** වංශයේ උපන් කුමාරිකාවකි. (......)

iv. කාලය, දීපය, දේශය, කුලය සහ මව යනු **පඤ්චවිලෝකනය යි.** (......)

v. භික්ෂුණීන් වහන්සේ විසින් **අෂ්ට ගරුධර්ම** පිළිපැදීම අනිවාර්ය වේ. (......)

vi. බෝසතාණන් වහන්සේ වප් මඟුල් දිනයේ දී **පිළිකුල්** භාවනාව වැඩූහ. (......)

vii. භික්ෂුව විසින් සිවුපස පරිභෝග කිරීමේ දී, ප්‍රත්‍යවේක්ෂා කිරීම අනිවාර්ය වේ. (......)

viii. පරුෂ වචන කීමෙන් වැළකීමේ **ශික්ෂාපදය** පංච ශීලයට අයත් වේ. (......)

ix. කෝලිය රට, දෙව්දහ නුවර අංජන රජුගේ බිසව වන්නේ **සුලක්ඛණා** නම් දේවිය යි. (......)

x. තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන් විසින් කුසතණ අටමිටක් බෝසතුන්ට පූජා කරන ලදී. (......)

**(ලකුණු 1x10 = 10)**

**04.** **කෙටි පිළිතුරු සපයන්න.**

i. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අංග අතරින් **තුනක්** ලියන්න.

............................................................

............................................................

............................................................

ii. සතර පෙර නිමිති අතරින් **තුනක්** ලියන්න.

............................................................

............................................................

............................................................

iii. සිදුහත් කුමරුගේ නම් තැබීමේ උලෙළට පැමිණි ප්‍රධාන බමුණන් අටදෙනා අතරින්, **තිදෙනෙකුගේ** නම් ලියන්න.

...............................................................

...............................................................

...............................................................

iv. සිවුපසය අතරින් **තුනක්** නම් කරන්න.

...............................................................

...............................................................

...............................................................

v. දහම් ගුණ අතරින් **තුනක්** ලියන්න.

...............................................................

...............................................................

...............................................................

**(ලකුණු 3x5 = 15)**

05. බුද්ධරත්නයේ ගුණ ඇතුළත් පාලි පාඨය ලියන්න.

...............................................................

...............................................................

...............................................................

...............................................................

...............................................................

**(ලකුණු 10)**

06. **චීවර ප්‍රත්‍යවේක්ෂාවට** අදාළ පාලි පාඨය ලියන්න.

...............................................................

...............................................................

...............................................................

...............................................................

...............................................................

**(ලකුණු 10)**

07. පහත සඳහන් ගාථා සම්පූර්ණ කරන්න.

**i. වණ්ණ ගන්ධ ගුණෝපෙතං**

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

**ii. දුල්ලභඤ්ච මනුස්සත්තං**

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

**iii. නිබ්බුතා නූන සා මාතා**

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

**iv. නමාමි බුද්ධං ගුණ සාගරන්තං**

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

**v. පස්සථ ඉමං තාපසං**

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

**(ලකුණු 3 x 5 = 15)**